**කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම - 2022**

**------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලි--යට අදාළ 13(ආ) වගන්තිය | සමාගමක කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳව විධිවිධාන සැලැස්විය යුතුය. කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ අංක 02 ප්‍රකාරව සමාගම, භාණ්ඩාගාරයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර පොදු ගිවිසුමක් (Master Agreement) ඇති කරගත යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ සඳහා පිළිතුරු වෙනම ලිපියක් මගින් ලබාදෙනු ඇත. | 2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම විසින් මෙම චක්‍රලේඛය පරිදි ප්‍රවාහන හිමිකම් නොමැති නිලධාරීන් 15 කට 2022 වර්ෂය තුළදී වාහන දීමනා ලෙස රු. 1,329,838 ක් සහ නිලධාරීන් 12 කට ඉන්ධන දීමනාව ලෙසද රු. 643,620 ක් ගෙවා තිබුණි.<br>ඉහත දීමනා ලබන නිලධාරීන් 15 දෙනා අතුරින් ව්‍යාපාර සංවර්ධන කළමනාකරුවෙකු වෙත 2022 නොවැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා උක්ත දීමනාවලට අතිරේකව ගමන් වියදම් දීමනා ලෙස රු. 188,500 ක්ද ගෙවා තිබුණි. | මෙහෙයුම් කටයුතු සඳහා කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්ට දිවා රාත්‍රියේ සමාගමේ රාජකාරී සඳහා පැමිණීමට සිදුවන බැවින් මෙම දීමනාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ගෙවීම් කටයුතු සිදුකර ඇත. සමාගමේ මාසික අපේක්ෂිත අලෙවි<br>ඉලක්ක සපුරා ගැනීමේ දීමනාව ලෙස නිවැරදි විය යුතුය. මෙම ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය | බදු පසු ලාභයෙන් අවම ලෙස සියයට 30 ක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | ජාතික විගණන කාර්යාලයෙන් විගණනය කරන ලද ගිණුම් ලැබීමෙන් පසු නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු 30% මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලැබේ. | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ ආරම්භ කළ කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 104,976,979 ක අතිරික්තයක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | **මානව සම්පත් කළමනාකරණ විශේෂඥ සේවාව ලබාගැනීම**<br><br>සමාගමක් විසින් තම ගිවිසුම්ගත මුදල වූ රු. 900,000 ට අමතරව තවත් රු. 700,000 ක් ලබා ගනිමින් කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ නිලධාරීන්ගේ මානව සම්පත් කටයුතු සඳහා කොළඹ නෙලුම් කුලුන පරිශ්‍රය තුළ වැඩමුළු පැවැත්වීමට කටයුතු නොකර හෝටල් 02 ක වැඩමුළු පවත්වා තිබුණි. එම වැඩමුළු සඳහා දැරූ තත්‍ය වියදම සමාගමට අනාවරණය කර නොතිබුණි. | 2023 පෙබරවාරි 08 සහ 09 දිනයන්හි කුරුවිට රිටිරීට් හිදී පවත්වන ලද වැඩසටහන හා 2023 පෙබරවාරි 28 සහ මාර්තු 02 දිනවල ගම්පහ වෙට් වෝටර් රිසෝර්ට් හි පවත්වන ලද වැඩසටහන්ය. ඒ සඳහා වෙනම ගෙවීම් සිදුකර ඇත. | ස්මාර්ට් ක්විස්ට් සමාගම සමඟ එළැඹි ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කොළඹ නෙලුම් කුලුන පිළිබඳ භෞතික පරීක්ෂාවේදී කුලුනේ නැරඹුම් මහලේ (29 වන මහල) බිත්ති ආලේපවලට හානිවන ලෙස නම් හා විවිධ රූප ඇඳ තිබුණි. පරිශ්‍රය තුළ ආරක්ෂක කැමරා පද්ධති සවිකර එය අධීක්ෂණය සඳහා සේවකයින් යොදවා තිබුණද අදාළ හානිය ගණනය කිරීමට හා හානි කළ පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | හානි කිරීම අවම කිරීමේ අරමුණින් දැනට නැරඹුම් පීටිකාවේ විදුලි ආලෝකයෙන් දැල්වෙන ප්ලාස්ටික් පුවරු සවිකර ඇත. තවද හානි කරනු ලබන පුද්ගලයින් ආරක්ෂක අංශ වෙතින් සහ සී.සී.ටී.වී. කැමරා පද්ධති මගින් නිරීක්ෂණය කරනු ලබන අතර එමඟින් හඳුනා ගන්නා පුද්ගලයින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරනු ලබයි. | නෙලුම් කුලුන නැරඹීමට පැමිණෙන අයවලුන්ගේ අයහපත් ක්‍රියාවන් පාලනයට පියවර ගත යුතුය. |
| (ඇ) | 2022 අගෝස්තු 02 දින අත්සන් කළ කළමනාකරණ ගිවිසුමේ වගන්ති අංක 7(b) හා 2023 අප්‍රේල් 10 දින අත්සන් කළ කල් බදු ගිවිසුමේ 2.2(u) ප්‍රකාරව සමාගම විසින් ලබාගත යුතු යන්ත්‍රෝපකරණ බිඳ වැටීමේ රක්ෂණය හා ඉලෙක්ට්‍රොනික රක්ෂණය 2023 සැප්තැම්බර් 30 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | දැනට මෙම ගොඩනැගිල්ලේ සියලු පහසුකම් වාණිජකරණය කොට නැති බැවින් දැනට යන්ත්‍රෝපකරණ බිඳ වැටීමේ රක්ෂණය සහ ඉලෙක්ට්‍රොණික රක්ෂණය ලබා ගැනීම අවශ්‍ය නොවන අතර සියලු ස්ථාන නුදුරේම වාණිජකරණය සිදුවූ පසු කළමනාකරණය හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර එකඟතාවයකට පැමිණ අවශ්‍ය පරිදි ඉහත රක්ෂණාවරණය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව සහ සුදුසු පරිදි සමාගමේ ආරක්ෂණයන් තහවුරු කළ යුතුය. |
| (ඈ) | සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ රු. 515,216 ක එකතු කළ අගය මත බදු ගනුදෙනුකරුවන්ගෙන් අයකර නොගෙන සමාගමේ ආදායමෙන් ගෙවා තිබුණි. | එම සංදර්ශනයෙන් ආයතනයට ලැබෙන රු. 1,750,000 ක මුදල පමණක් අය කරගෙන ඇත. | එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් උපායමාර්ගික සැලැස්මට සමගාමීව ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය පරීක්ෂා කළ නොහැකි විය. | 2022 වර්ෂයේ උපායමාර්ගික සැලැස්ම හා ව්‍යාපාර සැලැස්ම නොතිබුණු අතර 2023 වර්ෂයේ මෙම සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරන ලදි. ඉන් පසු ඉහත කී සැලැසුම් සකස් කිරීම් මානව සම්පත් කටයුතු පිළිබඳව සමාගමට උපදෙස් සපයන උපදේශන ආයතනය වන ස්මාර්ට් ක්විස්ට් ආයතනය විසින් 2024 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා කාලය වෙනුවෙන් සකස් කරගෙන යනු ලබයි. | උපායමාර්ගික සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |
| (ඊ) | 2022 වර්ෂයේ භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 දින දක්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි | එකඟ වෙමි. | සෑම වර්ෂයක් අවසානයේ ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | 2022 මාර්තු සිට දෙසැම්බර් දක්වා නිලධාරීන් 80 කට රු. 35,390,594 ක වැටුපක් ගෙවා තිබුණද එම වැටුප් හා දීමනා ලබා ගත් බවට කිසිඳු නිලධාරියෙකු වැටුප් පත්‍රිකාවල අත්සන් කර නොතිබුණි. | එකඟ වේ. එවකට මෙම සමාගමේ මූල්‍ය හා මානව සම්පත් අංශවල සිටි සීමිත සේවක සංඛ්‍යාව හේතුවෙන් මෙම කාර්යය ඉටු කිරිම නිසි පරිදි සිදු වී නොමැත. | සමාගම විසින් නිලධාරීන්ගෙන් වැටුප් හා දීමනා ලබාගත් බවට වැටුප් පත්‍රිකාවල අත්සන් ලබාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් කිසිඳු පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු නොකර සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 15, 16, 17 හා 18 දිනවල සමාගම් පරිශ්‍රයේ සංදර්ශනයක් පැවැත්වීම වෙනුවෙන් රු. 2,454,000 ක වියදමක් දරා තිබුණි. සමාගමට මෙම සංදර්ශනය පැවැත්වීම වෙනුවෙන් ප්‍රවේශපත්‍ර ආදායම් ලෙස රු. 700,000 ක් පමණක් ලැබී තිබීම හේතුවෙන් රු. 1,754,000 ක් අලාභයක් බවට පත්වී තිබුණි. | එකඟ වේ. සමාගම විසින් සැප්තැම්බර් මස 15, 16, 17 සහ 18 යන දිනවල මෙම සංදර්ශනය පවත්වනු ලැබූ මූලික හේතුව වූයේ එවකට නෙලුම් කුලුන පිළිබඳ ජනතා මතයේ ප්‍රතිචාර නොදන්නා බැවින් සහ ඒ වන විට ජනතාවට විවෘත වූයේ නැරඹුම් මැදිරි අවකාශය පමණක් වූ නිසාය. මේ හේතුවෙන් ජනතාව නෙලුම් කුලුන වෙත ආකර්ෂණය කර ගැනීමේ අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් ලෙස මෙම සංදර්ශනය සමාගමේ ආරම්භක උත්සවයට සමගාමීව පවත්වන ලදී.<br>නැරඹුම් මැදිරි ප්‍රවේශපත් ආදායම වර්ධනය වී ඇති බැවින් සංදර්ශනය සැප්තැම්බර් මස 18 වන දිනෙන් පසු නවතා දමන ලදී. | සමාගමට ලාභ ලැබෙන පරිදි සංදර්ශන පැවැත්විය යුතුය. |
| (ආ) | 2022 මාර්තු සිට 2022 දෙසැම්බර් දක්වා පුද්ගලික සමාගමකින් මිලදීගත් ටිකට්පත්වලින් රු. 2,087,000 ක් වටිනා ටිකට් පොත් 49 ක් භාවිතයෙන් ඉවත් කර මූල්‍ය අංශයේ පවතින සේප්පුව තුළ ගබඩා | එකඟ වේ.<br>සඳහන් කරන ලද ප්‍රවේශපත්‍ර මෙහෙයුම් ආරම්භ කළ අවධියේ අනුග්‍රහයකයින් විසින් දක්වන ලද අනුග්‍රාහක දායකත්වය මත මුද්‍රණය කරන ලද ටිකට්පත් වන අතර | නිසි පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන මිලදීගත යුතු අතර අවභාවිතයන් සිදුවීමේ අවදානම අවම කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබීමෙන් ඒවා අවභාවිතා කිරීමේ අවදානමක් පැවතුණි. | අනුග්‍රාහක කාලය අවසානයේ ඒවා නිකුත් නොකර නව අනුග්‍රාහකයෙකුගේ ටිකට්පත් අලෙවි කිරීමට සමාගම එකඟතාවයකට පැමිණ ඇත. එම නිසා මූල්‍ය අංශය වෙත ලැබුණු දිනයේ සිට වර්තමානය එනම් අද දක්වා මූල්‍ය අංශයේ පවතින සේප්පුවේ දින හා අනුක්‍රමික අංක සහිතව ආරක්ෂිතව එම ඉතිරි ටිකට්පත් ගබඩා කර ඇත. | |
| (ඇ) | නාමමාත්‍ර ඉන්වොයිස් පත්‍ර 04 ක් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 04 කට රු. 1,166,487 ක්ද, මිල කැඳවීම මත පදනම්ව ගෙවීම් වවුචර් 03 කට රු. 500,000 ක්ද, ඉන්වොයිසිවල ඡායා පිටපත් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 11 කට රු. 5,835,078 ක්ද, විද්‍යුත් තැපැල් මත පදනම්ව ගෙවීම් වවුචර් 03 කට රු. 185,004 ක්ද හා ඉන්වොයිසියක් නොමැතිව ගෙවීම් වවුචර් 03 කට රු. 2,445,000 ක්ද ලෙස අවස්ථා 24 කදී රු. 10,131,569 ක් ගෙවා තිබුණි. | එකඟ වේ. | නාමමාත්‍ර ඉන්වොයිස්, මිල කැඳවීම්, ඉන්වොයිස්වල ඡායා පිටපත්, විද්‍යුත් තැපැල් හා ඉන්වොයිසියක් නොමැතිව ගෙවීම් නොකළ යුතුය. |
| (ඈ) | 2023 සැප්තැම්බර් 08 දින ගබඩාව භෞතිකව පරීක්ෂා කිරීමේදී වටිනාකම රු. මිලියන 149.7 ක් හා ඇමරිකානු ඩොලර් මිලියන 1.1 ක් වූ ප්‍රවේශ පත්‍ර අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. | ආයතනයේ ප්‍රවේශපත්‍ර සුරක්ෂිතව තබා ගැනීමට ආරක්ෂිත කාමරයක් වෙන්කර ගැනීමට සැලසුම් කර තිබේ. | මුදල් හා මුදල් සමාන දෑ ආරක්ෂා කොට තබාගත යුතුය. |
| (ඉ) | සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී රක්නා ලංකා පෞද්ගලික සමාගම වෙතින් ආරක්ෂක සේවාව ලබාගෙන ඒ සඳහා බිල්පත් සමඟ පැමිණීමේ වාර්තා නොමැතිව රු. 12,504,910 ක් ගෙවා තිබුණු බැවින් ආරක්ෂක සේවාව සඳහා නියමිත නිලධාරීන් යොදවාගෙන තිබුණේද යන්න විගණනයට ගැටලු සහගත විය. | එකඟ නොවේ. සඳහන් කරන ලද සියලුම ආරක්ෂක සේවා සඳහා ගෙවා තිබූ බිල්පත් සඳහා ආරක්ෂක අංශයේ ප්‍රධානියා විසින් ඇනවුම් පිරිවිතරයට අදාළව ඉහත සේවාව පරීක්ෂා කර සහතික කර ඇත. එම සේවා ලැබීම් පදනම් කර කරගනිමින් ගිණුම් අංශයෙන් ගෙවීම් සිදුකර ඇත. | ආරක්ෂක සේවාව සඳහා ගෙවීමේදී පැමිණීමේ වාර්තා ලබාගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 සැප්තැම්බර් 21 දින මිලදී ගත් වටිනාකම රු. 1,190,250 ක් වූ රූපවාහිනී යන්ත්‍ර 03 ක් 2023 සැප්තැම්බර් 30 දින වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | ආරම්භක අවධියේ සමාගමේ අලෙවි ප්‍රවර්ධනය උදෙසා හා මහ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මිලදී ගත් රූපවාහිනී යන්ත්‍ර 12 ක් අතරින් 09 ක් පමණ භාවිතා කර ඇති අතර ඉතිරිය නැවත අවශ්‍ය වූ විට ලබාගැනීමේ අරමුණින් ගබඩාවේ සුරක්ෂිතව තබා ඇත. | වගකීම් කාලයක් සහිත වත්කම්වල අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන මිලදී ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු බැවින් සාධාරණ ප්‍රසම්පාදනයන් කළ බවට හා 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | සමාගම 2022 පෙබරවාරි මාසයේ ආරම්භ කිරීමෙන් පසු නෙළුම් කුලුනේ ඇති සම්පත් අධ්‍යයනයටත්, ඒ අනුව අලෙවි කරන සැලැස්මක් සෑදීමටත්, ක්ෂේත්‍රයේ අධ්‍යයනයකින් පසු ව්‍යාපාරික සැලැස්මක් සෑදීමටත් අත්‍යාවශ්‍ය වූ ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරින් සහ උපදේශකයින් කිහිපදෙනෙකු පමණක් බඳවා ගන්නා ලදි.<br>අතුරු අයවැයක් මගින් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සිදුවිය. මේ හේතුවෙන් සමාගම සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ආ) | **එල්.ඊ.ඩී. තිර මිලදී ගැනීම**<br>• එක් එල්.ඊ.ඩී. තිරයක් මිලදී ගැනීමට පමණක් ද්‍රව්‍ය අධියාචනා පත්‍රයකින් අනුමැතිය ලබාගෙන, වටිනාකම රු. 50,125,000 ක් වූ එල්.ඊ.ඩී. තිර 02 ක් මිලදී ගෙන තිබුණි.<br>• අතිරේක ලංසු ලියවිලිවල අංක 04 ප්‍රකාරව හා ලංසුව ප්‍රදානය කළ ලිපිය අනුව මෙම කොන්ත්‍රාත්තුව නිම කිරීමට දින 180 ක් ලබාදී තිබියදී, රු. 38,450,000 ක් වූ එල්.ඊ.ඩී. තිරය හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුට ලංසුව ප්‍රදානය කර තිබුණි.<br>• ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් කොන්දේසි අංක 06 යටතේ සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද, සියයට 05 ක කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කර තිබුණි.<br>• ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් කොන්දේසි අංක 10.2 හා 29 ප්‍රකාරව මාස 12 ක වගකීම් සහතික ලබාගැනීම හා නඩත්තු ගිවිසුමකට එළඹිය යුතු වුවද සමාගම විසින් එලෙස කර නොතිබුණි. | එකඟ වේ. 2022 වර්ෂයේ මුල් භාගයේදී මෙම සමාගම ස්ථාපිත කරනු ලැබූ අතර මෙම අවස්ථාවේදී නෙළුම් කුලුන වාණිජකරණය සඳහා අත්‍යාවශ්‍ය වන තනතුරු කිහිපයකින් සමන්විත ආයතන සංවිධානයක් සකසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි. මෙම අවස්ථාවේදී ප්‍රසම්පාදන කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවයක් පැන නොනැගුණු නිසා ප්‍රසම්පාදන කටයුතු සඳහා කාර්ය මණ්ඩලයක් බඳවා නොගන්නා ලදි.<br>මෙම අවස්ථාවේදී ප්‍රසම්පාදන කටයුතුද ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් සිදුකරන ලද අතර ඉහත සඳහන් නිලධාරීන් කිසිවෙකු සතුව රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ නිසි දැනුමක් නොතිබුණි.<br>එනමුත් ප්‍රසම්පාදන කළමනාකරුවෙකු නුදුරේදීම බඳවා ගැනීමටත්, ඉදිරි අවශ්‍යතාවයන් සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කිරීමටත් මෙම සමාගම විසින් අවශ්‍ය කටයුතු යොදා ඇත. | අනුමැතිය රහිතව වත්කම් මිලදී නොගත යුතුය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන පිළියෙළ කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | **රථ ගාල කොන්ක්‍රීට් කිරීම**<br>රථ ගාල කොන්ක්‍රීට් කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව රු. 662,375 ක් වූ අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු වෙත ප්‍රදානය නොකර දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුට රු. 908,000 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | එකඟ වෙමි.<br>මෙම උත්සවය 2022 දෙසැම්බර් 16 දිනට යෙදී තිබුණු බැවින් කාර්ය ඉටු කිරීමට දින 03 ක් ඇතුළත අවසන් කිරීමට තීරණය කරන ලදි. අවම ලංසුව ඉදිරිපත් කළ අයට එම මිලටම වැඩ නිම කළ හැකි බවට ලිඛිතව තහවුරු කරන ලෙස ඉල්ලා සිටි නමුත් ඔවුන් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලදි. මෙය අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් වීම හේතුවෙන් මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් පසු දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු හට කොන්ත්‍රාත්තුව ලබාදීමට තීරණය කරන ලදි. තවද මෙය ඉංජිනේරුවරයාගේ වටිනාකම තක්සේරු කිරීම මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සිදු කරනු ලබයි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූලව සහ පූර්ව සැලැස්මක් සහිතව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාගම විසින් ටිකට්පත් නිකුත් කරන ස්ථානයට සහ ප්‍රධාන ආරක්ෂක කුටිය සඳහා කැනපි වහල ඉදිකිරීම වෙනුවෙන් රු. 350,000 බැගින් රු. 700,000 ක් ගෙවා තිබුණද එම වියදම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා ප්‍රසම්පාදන ගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ නොවේ.<br>සමාගම ටිකට්පත් නිකුත් කරන ස්ථානය පමණක් නොව ප්‍රධාන ආරක්ෂක කුටියද කැනපි වහල ගැසීම් සමාලෝචිත වර්ෂය දක්වා සිදු විය. ඒ සඳහා සේවා සහතික කිරීමේ සහතික අංක 56 සහ අංක 18 යන සහතික කිරීම් පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන ගොනු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 3.2(ii) ප්‍රකාර නියමිත ක්‍රමවේදය අනුගමනය නොකර සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය හා වැටුප් ව්‍යුහය සකස් කර තිබුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි. | 2022 මාර්තු 21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අනු අංක 11 ට අනුව සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය (SOR) අනුමත කර ඇති අතර එය තවදුරටත් සමාලෝචනය කරන ලෙස උපදෙස් ලබාදී ඇත. තවද ඒ අනුව අත්‍යාවශ්‍ය වන තනතුරු සඳහා දැන්වීම් පල කර, වාණිජකරණය සිදුවන තෙක් යෝජිත වැටුප් ව්‍යුහය අනුමත කොට ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය එම රැස්වීමේදී ලබාදී ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලයකින් අනුමත කාර්ය මණ්ඩලයට හා වැටුප් ව්‍යුහය අනුමත කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී සමාගමට නිලධාරීන් 80 දෙනෙකු බඳවාගෙන ස්ථිර කර තිබුණද එම කාර්යය එක් එක් තනතුරු සඳහා අදාළ වන සුදුසුකම්, වැටුප් පරිමාන සහ බඳවා ගන්නා ක්‍රම ඇතුළත් අනුමත බඳවාගැනීමේ පටිපාටියක් අනුව කර නොතිබුණි. ඒ හේතුවෙන් තනතුරු සඳහා බඳවාගෙන ඇත්තේ සුදුසු නිලධාරීන්ද යන්න සහ එම අයට ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් සාධාරණද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. | එක් එක් තනතුරු සඳහා අදාළ වන සුදුසුකම්, වැටුප් පරිමාන ආදී විස්තර සහිත බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) සකස් කර තිබුණි. | අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් අනුව බඳවාගැනීම් කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂය තුළදී විවිධ තනතුරු සඳහා බඳවාගෙන තිබුණු 80 දෙනෙකු වෙනුවෙන් නිකුත් කරන පත්වීම් ලිපිවල පිටපතක් විගණකාධිපති වෙත එවා නොතිබුණි. | එම තනතුරු සඳහා වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඔවුන්ගේ අනුමැතිය ලබාගෙන ඇත. එම පත්වීම් ලිපිවල පිටපතක් පුද්ගලික ලිපිගොනුවල අමුණා ඇති අතර මින් ඉදිරියේදී එලෙස පත්වීම් ලිපිවල පිටපතක් ඔබට අවශ්‍ය නම් ඔබ වෙත ඉදිරිපත් කරන්නට කටයුතු කරනු ඇත. | පත්වීම් ලිපිවල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | එක් එක් නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුවල ඇතුළත් අධ්‍යාපනික හා සුදුසුකම්වලට අදාළ සහතික ඒවා නිකුත් කළ ආයතනවලින් පරීක්ෂා කරගෙන නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් පරීක්ෂා කරගෙන යනු ලබයි. තවද මේ වන විට මානව සම්පත් අංශය වෙතින් අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ සහතිකපත් සහ වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකපත්‍ර ඒවා නිකුත් කළ ස්ථානයක් වෙතින් පරීක්ෂා කරගෙන යනු ලබයි. | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික ඒවා නිකුත් කළ ආයතනවලින් පරීක්ෂා කළ යුතුය. |